## ශ්‍රීමත් අනගාරික ධර්මපාල 150 වන උපත් සමරු කලබ



**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **57 වන කාණ්ඩය** | **බු.ව. 2558 බිනර මස පුරපසළොස්වක ද ක්‍රි.ව. 2014 සැප්තැම්බර් මස 08 වන ද** | **05 වන කලබ** |

# දෙලොස් මහේ නැණ පහන යි හිමි ඔබ

සිරිමත් සිරි දම්පල් සමිඳාණෝ
බුදුනුවනට පෑයූ දිනිඳුණෝ
මෙ දැය හැදූ අසදිසි විරුවාණෝ
ඔබ යි දැයේ නියමුවා - පියාණෝ

දුප්පත් කම දුරැලන්නට පොහොසත්
එක්සත් කම දැය තුළ කළ සවිමත්
මිනිසත් කම නුවණින් කළ සිරිමත්
බෝසත් සිරිතින් දන ඔබ පසසත්

කෙලෙස් ගිරට නඟිනා දැය දැක දැක
නොලස් වෙමින් නො බලා දිව රෑ දුක
පසස් ම වේ කළ මෙහෙ පුද බිම් රැක
දෙලොස් මහේ පහන යි ඔබ සිරි ලක

**- අනඳ**



# ධර්මපාල අභිපූජන ප්‍රතිඥාව

මම පංචශීලය නම් වූ උතුම් මනුෂ්‍ය ධර්ම පහ සමාදන් ව දිවි හිමියෙන් ම ආරක්ෂා කිරීමටත් එමඟින් ආදර්ශවත් ව සමාජයට සාමය හා ශාන්තිය සලසන්නටත් උත්සාහවත් වෙමි.

මගේ රට, මගේ ජාතිය, මගේ ආගම, මගේ භාෂාව යන මේ මහානර්ඝ රත්න සතරක් මට තිබේ. මේ රත්න සතර ආරක්ෂා කරගැනීම මගේ පරම යුතුකම කොට සලකමි.

මම ආර්ය වූ ගුණයෙන් හා නුවණින් දියුණු වෙමින්, චිත්ත දමනයෙන් ද ඉන්ද්‍රිය සංවරයෙන් ද නොපසුබස්නා වීර්යයෙන් ද මගේ ජීවිතය නිසි ලෙස කළමනාකරණය කරගනිමින්, සමඟි දහමින් බැඳී අනුනට යහපත කරන්නටත්, අපගේ ශ්‍රේෂ්ඨ අදීන සංස්කෘතික හා ජාතික උරුමය පුනර්ජීවනයට පත් කොට ආරක්ෂා කරගන්නටත්, ඒ සඳහා ආගමාලයෙන් පිබිදුණු, ස්වදේශවාත්සල්‍යයෙන් ඔද වැඩුණු, ජාතිකාභිමානයෙන් මෙහෙයැවුණු, ස්වභාෂානුරාග යෙන් පණවත් වුණු, 'ධර්මපාල පරපුර'ට ඇතුළත් ව මගේ මාතෘ භූමිය ආරක්ෂා කරන්නටත් මම ඇප කැප වෙමි.

**(වෙසෙසින් ම පාසල් ළමයින් ගේ භාවිතය සඳහා ය.)**



# සිරි දම්පල් ගුණ සමරුව

**පරමපූජනීය පැළෑණේ සිරි වජිරඥාණ මහානායක මහාස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

ජාත්‍යාලයයෙන් ස්වජාතියේ යහපත සඳහා මෙහෙ කළ කෙනෙකුන් ගෞරවයෙන් සිහි කිරීම ඉතා පෙර සිට පැවැතෙන ශිෂ්ට චාරිත්‍රයක් බව ජාතක කතාවන්ගෙ නුදු ප්‍රකාශ වේ. ඒ ඉතා පෙර අතීතයෙහි බෝසතාණන් වහන්සේ වඳුරු වැ උපන් ජාතියෙක සිය දිවි පුද වඳුරු රැළ රැක ගැනීම ගැන සතුටු වූ රජතුමා ඒ බෝසතාණන් මෘත ශරීරය මහෝත්ස්වයෙන් ආදහනය කරවා අළු ගෙන මහාජන සඤ්චාරය ඇති ප්‍රසිද්ධ ස්ථානයෙක සොහොන් කොතක් පිහිට වූ බව දක්වා තිබේ. තිරිසන් වැ උපන ත් ස්වජාතියේ නිදහස ත් දියුණුව ත් ගැන දිවි පුදන තැනැත්තා ගෞරවයෙන් සිහි කිරීම ඉතා ම පෙර සිට පැවැතෙන ආර්ය චාරිත්‍රයක්වා පමණක් නො වැ පරෝපකාර ධර්මයට රුකුල් දීමක් ද වේ.

ධර්මපාල තුමා හෙවත් සිරිදේවමිත්ත ධම්මපාල යතිතුමා ස්වජාතියට පමණක් නො වැ ස්වසමයට ත් උදර මෙහෙයක් කළ සිංහල වීරයෙකි. ශතවර්ෂ කිහිපයෙකින් ම මෙ තරම් උදර දූරදර්ශී අදහස් ඇති ධෛර්‍යසම්පන්න සිංහලයෙක් මේ ජාතියේ නූපන්නේ ය. වෙන රටෙක

වෙන ජාතියෙක ත් ආගම ජාතිය දෙකට ම එක සේ මෙහෙ කළ මෙ වැනි උතුමකු සොයා ගැනීම උගහට ය.

ඉතා බාල කාලයෙහි සිට මැරෙන මොහොත දක්වා ත් නොපසුබස්නා වීයඝීයෙන් ක්‍රියා කළ සැටි මෙතුමාගේ චරිතය දෙස සිත් යොමු කරන්නකුට හොඳින් වැටැහෙයි. මෙ තුමා ඉතා තරුණ කල්හි දී ම ගිහි කටයුතු අත්හැර ලංකාවේ පරමවිඥනාථීබෞද්ධසමිතියේ උසස් සහායකයකු වැ ඒ මගින් ලංකාවේ බෞද්ධාධ්‍යාපනයට මහත් ආධාරයක් කෙළේ ය. “බුඩිස්ට්” නමැති බෞද්ධ ඉංගිලීසි සඟරාවට ත් සඳරැස පත්‍රයට ත් මුල දී බොහෝ උපකාර කෙළේ ය. 1884 දී ඕල්කට්තුමා සහ බ්ලැවට්ස්කි මැතිනියත් සමඟ ආදියාර් පෙදෙසට ගොස් විසි වසක් පමණ නිතර එහි වෙසෙමින් දඹදිව බුද්ධාගම දියුණුව පිණිස බොහෝ මෙහෙ කෙළේ ය. එහි බෞද්ධ විහාරය තැනීමට ද විශේෂ උපකාර කෙළේ ය. කොළඹ බෞද්ධ යන්ත්‍රාලයය පිහිටුවීමටත් බොහෝ උපකාර කෙළේ ය. 1888 පමණේ දී දෙන් ඩේවිඩ් යන නම අත් හැර ආගමට ත් ජාතියට ත් ගැළැපෙන “ධර්මපාල” යන ආයඝී නාමය ගත්තා පමණක් නො වැ, මුළු සිංහලයන් අතර ආයඝී නම් ගැනීම පිළිබඳ උද්ඝෝෂණයක් කෙළේ ය. අබෞද්ධ සිංහලයන් පවා එයට අද ත් අවනත වැ ඇදී එන බව පෙනේ. සිංහල ඇඳුම ගැන ද සිංහල ස්ත්‍රීන්ට සාරිය පුරුදු කැරැවීම ගැන ද කලින් ම උද්ඝෝෂණය කෙළේ මෙතුමා ය. ජපන් රට, යුරෝපයේ නොයෙක් පළාත්, අමෙරිකාව ආදි විදේශයන්හි ද ආගම පිළිබඳ කථා පැවැත්වීමෙන් මහත් උද්ඝෝෂණයක් කෙළේ ය. 1891 පමණේ දී මහාබෝධි සමාගම ආරම්භ කළ තැන් පටන් ඒ සමාගමය මඟින්

විශේෂයෙන් දඹදිව ත් ලක්දිව ත් යුරෝපයේ ත් සිදුකළ තාක් ආගමික මෙහෙය ආශ්චර්‍යයී වේ. විශේෂයෙන් දඹදිව විහාරාරාමයන් ඇති කිරීම, භික්ෂූන් නැවැත්වීම, පාසල් ඇති කිරීම, ධර්‍මප්‍රචාරකෘත්‍යයන් හැටියට ඉංගිලීසි, හින්දි ආදි භාෂාවලින් පත් පොත් විසුරුවා හැරීම, නොයෙක් දේශනා පැවැත්වීම යන ආදිය ත්, ලක්දිව ත් නොයෙක් බෞද්ධ පාඨශාලා, පුණ්‍යාරොගශාලා, රෙදි විවීම්, ගිනිපෙට්ටි තැනීම් ආදිය පිළිබඳ කාර්මිකශාලා, අනාථ ශාලා ආදියත්, සිංහල බෞද්ධ පත්‍රයෙන් සහ නොයෙක් දහම් පත් පොත්වලින් මහාබෝධි යන්ත්‍රාලයය මඟින් ධර්‍ම ප්‍රචාර කටයුතු ත් සැලැස්වීම් ආදිය සිහිවන විට මේ විශාල ආගමික ජාතික මෙහෙයෙහි කොටස්වල නාම ලේඛනය වත් මෙ බඳු ලිපියෙකින් නො නිමියැ හැකි ම ය.

එබැවින් රටට ත් ආගමට ත් සිංහල ජාතියට ත් පමණක් නො වැ විදේශයන්හි දු බොහෝ දෙනාට ත් වැඩ සඳහා ස්වකීය ධනය ත් සැපත ත් ඥනය ත් මුළු කාලය ත් කැපකොට බොහෝ වෙහෙස වින්ද වූ ද එය වෙහෙසකැ යි කවරද වත් නොසිතුවා වූ ද නිර්භීත වූ ද ස්ථිරාධිෂ්ඨානවත් වූ ද ඒ සිංහල බෞද්ධ වීරෝත්තමයා සිංහල ජාතිය ත් බුද්ධාගම ත් පවත්නා තෙක් ම ගෞරවයෙන් සිහි කටයුතු බව ත් අද පවත්නා සිංහලයන්ගේ ජාතික ප්‍රබෝධයේ ආදිකතෘවරයා එතුමා බැවින් අබෞද්ධ සිංහලයනු ත් මේ ගුණානුස්මරණෝත්සවයට සහාය විය යුතු බව ත් සඳහන් කෙරෙමින් මෙතෙකින් මෙය සමාප්ත කරමි.

***කොළඹ ධර්මපාල ගුණානුස්මරණ සභාවේ වාර්ෂික ගුණ සමරුව වෙනුවෙන් ලියන ලද්දකි.***



# - අනගාරික ධර්මපාල -
# ජාතියට ජීවය දුන් ජාතියේ පියා

**ගෞරවාර්හ ගණේගම සරණංකර**
**නාහිමිපාණන් වහන්සේ විසිනි**

පසුගිය අවුරුදු 100 තුළ මේ රටේ දේශපාලනය පිළිබඳ ඉතිහාසය, සංස්කෘතිය පිළිබඳ ඉතිහාසය හා සමාජය පිළිබඳ ඉතිහාසය ගැන මනා දැනුමක් ලබාගත් පක්ෂපාත, මධ්‍යස්ථ විචාරකයෙකුගෙන් ඒ කාලය තුළ මේ රටේ ඉපදී සිටි ශ්‍රේෂ්ඨතම වීරවරයා කවරෙක් දැයි ඇසුවොත් "අනගාරික ධර්මපාලතුමා" යයි අවංකව නොපැකිල කියනු ඇත. එපමණක් නොව එතුමා 19 වැනි ශතවර්ෂයේ අග භාගයේ විසූ අපේ ජාතියේ පියා යයි මම නිර්භීතව, නිර්ලෝභීව ප්‍රකාශ කරමි. මේ ප්‍රකාශය කළ යුත්තේ මා විසින් නොව මුළු මහත් ජාතිය විසිනි. රට වෙනුවෙන් දිවි පිදූ ජාතික වීරයන්ට දිය යුතු නියම තැන දීමට මැළි වීම හා ප්‍රමාද වීම තාමත් අප තුළ පවත්නා ජාතික දුර්වලකමකි. මේ දුර්වලකම වැඩියෙන් ඇත්තේ පොදු ජනයා තුළ නොව වගකිය යුත්තන් තුළ ය.

එක පුද්ගලයෙකුගේ ප්‍රතිමා පහක් කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, කුරුණෑගල ආදී නගරයන්හි පොදු ජනයා

විසින් පිහිටුවා ඇත්නම් ඒ අනගාරික ධර්මපාලතුමා ගේ ය. ඒ අතරින් බලන විට පොදු ජනතාව එතුමාට දිය යුතු ගෞරවය සෑහෙන පමණකින් දී ඇත. එතුමා කළ අපරිමිත, අමරණීය සේවය තාමත් අගය කොට සලකන්නේ පොදු ජනතාව ය. පොදු ජනතාව එතුමා ගේ ප්‍රතිමා අනාගතයෙහි තව තවත් පිහිටවනු නිසැක ය. ප්‍රතිමා අවශ්‍ය වැඳීමට නොව අනාගත පරපුරට දැකගැනීමට හා දැනගැනීමට ය.

අනගාරික ධර්මපාලතුමා ගැන ලියන්නකු විසින් පළමුකොට ම ඔහු විසූ යුගයත්, උපදින විට මේ රටේ පැවති දේශපාලන හා සමාජ තත්ත්වයත්, ඔහු හැදුණු වැඩුණු පසුබිමත් ගැන කරුණු දැක්විය යුතු ය. ඒ ගැන ලිවීමේ දී මේ රට ආක්‍රමණය කළ හා බලෙන් පාලනය කළ විදේශිකයන් ගැන ද, සිංහලයන් හා බුද්ධාගම මුහුණපා තිබුණු පිරිහීම් තත්ත්වය ගැන ද කෙටි විස්තරයක් නොලීවොත් ධර්මපාල චරිතය අංගසම්පූර්ණ චරිතයක් ලෙස ගිනිය නො හැකි වනු ඇත.

ධර්මපාලතුමා පැවැත්වූ දේශනාත්, ලියූ ලිපිත්, කළ ශාසනික වැඩත්, ගතකළ ආදර්ශවත් පිරිසිදු සිල්වත් ජීවිතයත්, යෙදවූ විශාල ධනස්කන්ධයත්, අන්තිමට මුළු ජීවිතය ම පරිත්‍යාග කිරීමත් ගැන ඉතාම පරීක්ෂාකාරීව මැදහත්ව සලකා බැලුවොත් එතුමා හා සමාන සිංහල වීරයෙක් මුළු සිංහල ජාතියේ ම ඉපිදී නැතැයි ද මුළු ජාතිය ම එතුමාට ණයගැති ය යි ද සිතෙනු ඇත.

එතුමා කළ සේවය හරිහැටි දනිතොත්, ඒ සේවයට කෘතගුණ සලකතොත් ලංකාවේ හැම සිංහල බෞද්ධ ගෙදරක ම එතුමාගේ පින්තූරය තිබිය යුතු ය. හැම මව්පියෙකුන් ම එතුමා ගැන දූ දරුවන්ට කියා දිය යුතු ය. රජ ගෙදර සිට රජයේ හැම කාර්යාලයක ම එතුමාගේ පින්තූරය එල්ලා තැබිය යුතු ය. "ජාතියට ජීවය දුන් පියා" යයි හැඳින්විය යුතු ය. ජාතියට ශක්තිය හා පෞඪත්වය ලබා ගැනීම සඳහා හැම ප්‍රසිද්ධ නගරයක ම එතුමාගේ ප්‍රතිමාවක් තිබිය යුතු ය. එතුමා උපන් දින හෝ අපවත් වූ දින නිවාඩු දිනයක් කොට, එතුමාගේ ප්‍රතිමාව රැගෙන නගර ගම් නියම් ගම්වල පෙරහැර පවත්වා බාල පරපුරට එතුමා හොඳින් හඳුන්වා දිය යුතු ය. එතුමාගේ ජීවන චරිතය හැම සිංහල ශිෂ්‍ය ශිෂ්‍යාවකට ම අනිවාර්යයෙන් ම කියවන්නට සැලැස්විය යුතු ය.

අපේ තරුණ පරපුර මාක්ස් ලෙනින්, මාවෝ සේතුං, පිදෙල් කස්ත්‍රෝ ආදීන්ගේ චරිත කථා ඕනෑ තරම් කියවති. ඒවා නොයෙක් භාෂාවලට නගා ලෝකයේ හැම කෙනෙකුට ම කියවන්නට සලස්වා ඇත. එහෙත් ධර්මපාල චරිතය අපේ තරුණ තරුණියන් සියයට පස්දෙනෙකු වත් කියවා නැත. මෙය ජාතියේ අවාසනාවකි. අභාග්‍යයකි. මෙහි වැරදිකාරයෝ කවුරුද?

අද අපි ලබා ඇති දේශපාලන නිදහසක් හෝ ආර්ථික දියුණුවක් හෝ වෙන කිසියම් දියුණුවක් හෝ ඇත්නම් ඒ සියල්ලෙහි නිර්මාතෘවරයා එතුමා ය. එතුමා නූපදින්නට මේ රටේ අද පවත්නා තත්ත්වය මෙයට වඩා හාත්පසින්

වෙනස් වන්නට තිබිණි. එතුමා සිංහල බෞද්ධයාගේ පුරාකෘත පුණ්‍ය බලයකින් මෙන් පහළ වූ වීරයෙකි.

පණ්ඩුකාභය රජතුමා අනුරාධපුරය වැනි අගනා නගරයක් නිර්මාණය කළේ ය. දෙවනපෑතිස් රජතුමා බුද්ධාගම වැලඳගෙන ජාතිය බෞද්ධ කළ, ප්‍රථම සිංහල රජතුමා බවට පත්විය. දුටුගැමුණු රජතුමා ද්‍රවිඩයන්ගෙන් රටත්, ජාතියත්, ශාසනයත් මුදවා ගත්තේ ය. මහා පරාක්‍රමබාහු රජතුමා මුළු ලංකාව එක්සේසත් කොට, විදේශවල පවා යටත් රාජ්‍ය ඇතිකොට, ලංකාව පෙරදිග ධාන්‍යාගාරයක් බවට පත් කෙළේ ය. රාජසිංහ රජවරු පෘතුගීසීන් හා ඕලන්දයන් සමඟ නිර්භීත ලෙස සටන්කොට රට රැක ගත්හ. වැලිවිට සංඝරාජ මාහිමියන් නැති වී ගිය භික්ෂු සමාජයට නව ජීවයක් දුන්නේ ය. කර්නල් ඕල්කොට්තුමා බෞද්ධ අධ්‍යාපනය දියුණු කළේ ය.

මේ සියල්ලෝ ම රටට අවශ්‍ය එක් එක් ක්‍රමයේ ඇති උතුම් සේවාවන් සිදු කළෝ ය. එහෙත් මේ කිසිවෙකු "ගොන් තඩියා", "වල් අලියා" යයි කියමින් ජාතියට බැණ වැදුනේ නැත. බැණ වැදී නිදා සිටි ජාතිය නිර්භීත කළේ නැත. බාගෙට මැරී සිටි ජාතියට ප්‍රාණ වායුව පිම්බේ නැත. මේ කිසිවෙකු ලෝකයේ සෑම රටකට ම පාගේ ගොස් බුද්ධ ධර්මය ප්‍රචාරය කළේ නැත.

මේ කිසිවෙකු බුද්ධ ධර්මය උපන් දඹදිවින් එය අතුරුදහන්ව ගොස් තිබියදී එයට පුනර්ජීවය දුන්නේ නැත. මේ කිසිවෙකු බුද්ධගයාවට බෞද්ධයන්ට අඩියතියන්ට

බැරුව තිබියදී මහා සටනක් කොට එය බේරා ගත්තේ නැත. මේ කිසිවෙකු රට වෙනුවෙන් බන්ධනාගාර ගතවූයේ නැත. මේ කිසිවෙකු "මහාබෝධි සමාගම" වැනි ධර්ම ප්‍රචාරක සභාවක් පිහිටුවා එනමින්ම ඉංග්‍රීසි සඟරාවක් මුද්‍රණය කරවා, "සිංහල බෞද්ධයා" වැනි පත්‍රයකින් බුද්ධාගම ප්‍රචාරය කළේ නැත. මේ කිසිවෙකු මූලගන්ධකුටි විහාරය වැනි අගනා මහා විහාරයක් පිටරටක කරවූයේ නැත. මේ කිසිවෙකු බුදුරදුන් ප්‍රථම ධර්මදේශනාව පැවැත්වූ බරණැස ඉසිපතනයට ගොස් මහණ වී උපසම්පදා වී අන්තිම හුස්ම හෙළුවේ නැත.

ධර්මපාලතුමා තරම් වැඩ කරපු සිංහලයෙක් වෙන නැත. එතුමා තරම් රට රාජ්‍යයන්හි ඇවිදපු සිංහලයෙක් වෙන නැත. එතුමා තරම් කථා පැවැත්වූ සිංහලයෙක් වෙන නැත. එතුමා තරම් පරිත්‍යාග කළ සිංහලයෙක් වෙන නැත. එතුමා තරම් රට, ජාතිය, ආගම වෙනුවෙන් දුක් විඳපු සිංහලයෙක් වෙන නැත. එතුමා තරම් බැණුම් අහපු සිංහලයෙක් වෙන නැත. එතුමා තරම් බැණපු සිංහලයෙක් වෙන නැත. එතුමා තරම් ලියාපු සිංහලයෙක් වෙන නැත. එක මිනිස් දිවියක දී අවුරුදු 50ක් තුළ එතුමා කරපු වැඩ මෙතෙක් මේ රටේ උපන් කිසිදු සිංහලයෙකු කර නැත. ඒ වැඩ රාශිය සිංහලයන් දසදහසකට ද කළ නො හැකි තරම් ය.

කෘතගුණ සලකන හැම සිංහලයෙකු ම ධර්මපාලතුමාගේ නම උදේ සවස සිහිකළ යුතු ය. බෝධිසත්වවරයෙකුට අවශ්‍ය සියලු ම ගුණාංග එතුමා තුළ පිහිටියේ ය.

සිංහලයාගේ ඇති හැම දුර්වලකමක් ම ඔහු දුටුවේය. දැක පෙන්නුවේය. ඒවා නැතිකර ගන්නා හැටි කියා දුන්නේ ය. කෘෂිකර්ම දියුණුවත්, කර්මාන්ත දියුණුවත් එකසේම අවශ්‍ය බව පෙන්වා දුන්නේ ය. කර්මාන්ත අතින් දියුණු රටවලට ගොස් කර්මාන්තශාලා පරීක්ෂා කොට බලා මෙහි ඇවිත් පේෂ කර්මාන්තය, ගිනිපෙට්ටි කර්මාන්තය ආදිය ආරම්භ කළේ ය. සිංහලයන් ආගම භක්තිය ඇති නිර්භීත යහපත් චරිත ඇති සැබෑ බෞද්ධයන් ලෙස සිටිනු දැකීම ඔහුගේ එක ම බලාපොරොත්තුව විය. භික්ෂූන් වහන්සේලාට ඇති අප්‍රමාණ ගෞරවය නිසා වැරදි පෙන්වා දුන්නේ ය.

සිංහලයන් දැන් සිංහල නම් භාවිතා කරන්නේ ධර්මපාලතුමා නිසා ය. සිංහල ස්ත්‍රීන් දැන් සාරිය, ඔසරිය අඳින්නේ එතුමා නිසා ය. සිංහලයන් නැම් පනා ගැසීම නැවැත්තුවේ එතුමා නිසා ය. සිංහලයන් දැන් කලිසම ඇඳ එයට උඩින් රෙද්ද නාඳින්නේ එතුමා නිසා ය. සිංහලයන් දැන් ජාතික ඇඳුම අඳින්නේ එතුමා නිසා ය. සිංහලයන් දැන් ඕනෑම ලොක්කෙකු ඉදිරියේ කෙලින් සිටින්නේ එතුමා නිසා ය. සිංහලයන් දැන් දඹදිව වන්දනාවේ යන්නේ එතුමා නිසා ය. කොටින්ම දැන් සිංහලයන් තම රට තමන් ම පාලනය කරන්නේ එතුමා නිසා ය. මේ රටේ නිදහසේ නිර්මාතෘවරයා අනගාරික ධර්මපාලතුමා ය. ජාතියේ පියා එතුමා ය.

පැරණි සිංහලයන්ට තිබුණු ශ්‍රේෂ්ඨ ගුණයක් නම් ජාත්‍යාලය හා ස්වදේශාලය යි. ඒ ගුණය දැන් භයානක

ලෙස ජාතියෙන් අතුරුදහන් වී ගෙන යයි. ඉන්දියාව වැනි විශාල රටක් ළඟ ඇති ලංකාව වැනි කුඩා දූපතක් පසුගිය වර්ෂ 2500 තුළ ඉන්දියාවේ යටත් විජිතයක් වෙන්ට නොදී රැකගැනීම ලෝක පුදුමයකි. මෙයට එක ම හේතුව පැරණි සිංහලයන් තුළ පැවති ජාත්‍යාලය සහ ස්වදේශාලය යි. ධර්මපාලතුමා ජාත්‍යාලයේ ස්වදේශාලයේ මූර්තියකි. එතුමා ආශ්‍රය කළ අයට, එතුමාගේ දේශනා ඇසූ අයට, එතුමාගේ ලිපි කියවූ අයට, එතුමාගේ ගෝලයන්ට, එතුමාගේ සේවකයන්ට පමණක් නොව එතුමා යන්තම් හරි දුටු අයට පවා පුදුමයට මෙන් ජාත්‍යාලය හා ස්වදේශාලය ඇති වී තිබේ. නැතහොත් ඒ අය තුළ අනිත් අයට වඩා රට, ජාතිය, ආගම ගැන විශේෂත්වයක් දක්නට ඇත.

**මේ රටට වෙලා තියෙන ලොකු ම විපත ධර්මපාලතුමා අමතක කිරීම යි. එතුමාගේ දේශන අමතක කිරීම යි. එතුමා කළ සේවය අමතක කිරීම යි. එතුමා පෙන්වූ මඟ නොයෑම යි. එතුමාගේ උපදෙස් පිළිනොපැදීම යි. අවුරුදු 47ක් මුළුලුලේ රට, ජාතිය හා ආගම දියුණු කරණු සඳහා එතුමා ගත් දැඩි උත්සාහය ගැන නොතැකීම යි.**

ධර්මපාලතුමාගේ චරිත කථාව හැම සිංහල ශිෂ්‍ය-ශිෂ්‍යාවක් ම මැනවින් දතයුතු ය. දැන ගෙන එය අනුග මනය කළ යුතු ය. දැන් ධර්මපාලවරුන් බිහිකිරීමට නම් ධර්මපාල චරිතය හැකි තරම් ප්‍රචාරය කළ යුතු ය. හැම පාසැලකම උගැන්විය යුතු ය. විශ්වවිද්‍යාල පර්යේෂණ විෂයයක් කළ යුතු ය. ධර්මපාල රූපය හැම සිංහලයෙකුට

ම නිතර ම දැකගන්නට හැකි ලෙස සුලභ කළ යුතු ය. හැම ගෙදරක ම, හැම ආයතනයක ම, හැම කාර්යාලයක ම දේශපාලන භේදයෙන් තොර ව එය එල්ලා තැබිය යුතු ය.

ඩඩ්ලි සේනානායක රජය විසින් පත්කරන ලද අනගාරික ධර්මපාල ජන්ම ශත සංවත්සරය උත්සව කාරක සභාව මගින්, අතිදක්ෂ උගතෙකු හා සිවිල් නිලධාරියෙකු වූ ආචාර්ය ආනන්ද ගුරුගේ මහතාගේ සංස්කාරකත්වයෙන් ප්‍රකාශ කොට ඇති, ධර්මපාල ලිපි (සිංහල හා ඉංග්‍රීසි ලිපි) සහ Anagarika Dharmapala – Return to Righteousness නමැති පොත් දෙක ඉතා උසස් කෘති දෙකකි. එය ආනන්ද ගුරුගේ මහතාගේ දක්ෂකම් පෙනෙන කැඩපතක් බඳු ය. ඩේවිඩ් කරුණාරත්න මහතා ලියා ඇති ධර්මපාල චරිතය ද ඉතා අගනා කෘතියකි. ධර්මපාල චරිත තව තවත් ලියා වර්තමාන තරුණ පරපුරට කියවන්නට සැලැස්වීම තම රට ජාතිය ගැන තරුණ පරපුරේ සිත් යොමු කරවීමේ හොඳ ම උපාය මාර්ගයකි.

පෘතුගීසි, ඕලන්ද, ඉංග්‍රීසි යුග ගැන ලියා ඇත්තේ ධර්මපාල නමින් වීරවරයෙකු පහළ වීමට හේතු පෙන්වීමට මිස අන්‍ය භක්තිකයන්ගේ සිත් රිදවීමට නොවන බව අවධාරණයෙන් කියමි. අන්ධකාර යුගය පිළිබඳ විස්තරය තනිකර ඉතිහාසගත කරුණු රැසකි. අන්‍යාගමිකයන්ගේ සිත් නොරිදවීම බුදුන් වහන්සේ තුළ පැවති උතුම් ම ගුණාංගයකි. එය බෞද්ධයන් තුළ ද එසේ ම පවතී.

ධර්මපාලතුමා විශේෂ පුද්ගලයෙකි. අවස්ථාව අනුව පහළ වූ වීරයෙකි. එතුමා අන්‍යාගමිකයන්ට දෙස් කීවේ ඔවුන් සමඟ තරහෙන් නොව බෞද්ධයන්ට ඇති අසීමිත ආදරය නිසා ය.

ඉන්දියාවට නොගිය කිසිවෙක් ධර්මපාලතුමා ගැන නියම හැටියට නො දනිති. මම ඉන්දියාවේ වර්ෂ 5ක් සිටියෙමි. ඉන් වර්ෂ 3ක් කල්කටාවේ මහාබෝධි සමාග මෙත් වර්ෂ 2ක් ශාන්ති නිකේතන විශ්ව විද්‍යාලයේත් ගත කළෙමි. කුඩා කල මා විද්‍යෝදය පිරිවෙණේ ඉගෙන ගනිද්දී ධර්මපාලතුමා සිටියේ ඒ ඉදිරිපිට මහාබෝධි සමාග මට අයත් නිවසක ය. එහි දී එතුමා නිතර දිටිමි. එතුමාට ඇති බිය නිසා ඉදිරියට ගොස් කථා නො කෙළෙමි. එතුමා එහි සිටි කාලයේ පිළිපැද්ද හැටි හොඳින් දනිමි. දඹදිව නවතින්නට ගිය දිනට පෙර දින විද්‍යෝදය පිරිවෙණේ සුමංගල ධර්මශාලාවේ දී 500 ක් පමණ මහා සංඝයා ඉදිරියෙහි කළ එතුමාගේ අන්තිම කථාව අසා සිටියෙමි. එය අසා සිටි මහතෙරුන්නාන්සේලාගේ දෑසින් කඳුළු කැට කඩා වැටෙනු බලා සිටියෙමි.

ධර්මපාලතුමා පිළිබඳ මෙහි එක ද අතිශයෝක්ති වචනයක් නැත. මා තරමට එතුමා ගැන දන්නා ඕනෑම කෙනෙකු ලියන හැටියට යි මා මෙහි ලියා ඇත්තේ. මෙය අන්ධ භක්තියෙන් ලියූ වීරාභිවාදනයක් නොව එතුමා පිළිබඳ ඇති තතු ඇති සැටියෙන් ලිවීමකි.



# ශ්‍රීමත් අනගාරික ධර්මපාල සමරු ගීතය

අඳිරදවාදේ උදම් හැඟුම් බිඳ
සිහ සර නැංවූ, පා නිදහස තෙද
සිරිමත් සිරි දම්පල් උතුමාණන්
දැයේ නමින් සමරමු එක් වී
පෙරට ම යමු අපි එක්සත් වී

හෙළ බොදු කම සිය පණ සේ සලකා
හෙළයෙහි හැම දන වෙත සෙත සලසා
නිඳි ගැට හරවා රට ම අවදි කළ
දැයේ පියා - නියමුවා ඔබ යි

දහමින් එඩියෙන් අවිහිංසාවෙන්
පසු නොබසින ඉදු අදිටන් ගුණයෙන්
බුද්ධගයාවේ ඔබ කළ වික්මය
අද ද සැදැහැ නෙත් තෙත් කරවයි

අදීන මං පෙත - සදහම - සුසිරිත
ඉසුරු නඟා කම්හල් ගොවිකම් කෙත
සදනුව අප ජාතික ජය මාවත
වඩින්න උතුමනි යළි ලක්බිම වෙත.

රැසැයුම :- **තිරිකුණාමලේ ආනන්ද මහනා හිමි.**



# සමගිකමින් ක්‍රියා කිරීම

"ධර්මපාල ලිපි" නමැති කෘතියෙන්
උපුටා ගත්තකි.

සිංහලයාගේ ලේ උරාබොන්ට ව්‍යාඝ්‍ර රංචුවක් සැරසී සිටිති. මේ කාලයේ සිංහලයන් සමගියෙන් ක්‍රියාකටයුතුයි. දුෂ්චරිත ක්‍රියා කරන්නා වූ යුරෝපීය මිථ්‍යාදෘෂ්ටිකයන් අනුවයාම හේතුකොටගෙන සිංහලයන්ට වේගෙණ යන අන්තරාය ගැණ සැලකීම වටී. මේ සම්බන්ධව මෙහි දක්වන වඩ්ඪකී සූකර ජාතක කථාව කියවීම මැනවී. මෙය ජාතක පොතේ තික නිපාතේ දක්නා ලැබේ.

අතීතයේ බරණැස බ්‍රහ්මදත්ත රජකරණ කාලයේ බෝධිසත්ත්වයෝ රුක්ඛ දේවතාව උපන්හ. බරණැස අසල ගමක වඩු කර්මය කරන්නෝ වාසය කළෝය. ඔවුන්ගෙන් එක වඩුවෙක් ආරණ්‍යයට ලීදඬු කැපීමට ගියේ ය. වළක වැටී සිටි සූකර පෝතකයෙක් දැක ඌ ගොඩට ගෙන ස්වකීය ඝරයට ගෙණගොස් ඇතිකළේය. වෘද්ධිභාවයට පැමිණියාවූ සූකර පෝතකයා වඩ්ඪකී සූකර නමින් ප්‍රකට විය. වඩුරාල ලී කැපීමට ගියාම සූකරයා ලී පෙරලීමට ආධාර වන්නේය. අන්‍ය කෙනෙක් මූ මරාකායයි භයින්

ආරණ්‍යයට ගෙණගොස් යන්ට හැරියේය. ආරණ්‍යයට ප්‍රවිෂ්ටවමම වසන ස්ථානයක් සොයා පර්වත අන්තරෙ මහා ගුහාවක් දර්ශනය කොට වසන ස්ථානයට යහපතැයි සිතුයේයි සිය ගණනක් සූකරයෝ මොහු කරා පැමිණියෝයි. මොවුන් දක සූකරයා නුඹලා දුටුවා යහපත මේ ස්ථානය රමණීයයි මෙතැන වාසයකරමි කීයේ ය.

මේ ස්ථානය රමණීයයි කීම සත්‍යයයි නමුත් අන්තරා සහිතයි සූකරයෝ උත්තර දුන්නෝය. මමද කල්පනාකළෙමි. මෙවැනි ගෝචර සම්පන්න ස්ථානයක වසනවුන් ශරීර දුර්වලව මාංශ ලේ නැතිව සිටින්නේ මන්ද කුමක් නිසාද වඩ්ඪකී සූකරතෙම අරණ්‍ය වාසී සූකරයන්ගෙන් විචාළේයි. ප්‍රාතඃ කාලයෙහි එක ව්‍යාඝ්‍රයෙක්විත් දුටු දුටු සූකරයා ගෙණ යන්නේය. කුමක්ද මොහු නිබද්ධවම ගෙනයනවාද අතරින් පතරද? නිබද්ධවම ගෙණයයි. ව්‍යාඝ්‍රයෝ කොපමණද? එකෙක් පමණයි. තොප එක්කොටම එකෙකුට විරුද්ධවෙන්නට ශක්තිය නැද්ද? එසේය ශක්තිය නැත. මම කියනදේ කරතොත් මූ ගෙණ දෙන්නෙමි. මේ ව්‍යාඝ්‍රයාගේ වාසය කොහෙද? ඈත පෙණෙන පර්වතයේ ය. වඩ්ඪකී සූකරතෙම ඒ රාත්‍රියේ ම සූකරයන් එකතුකොට යුද්ධකිරීම ත්‍රිවිධාකාරයි කියා පුදුමවූ විධියට සූකරයන් රැස්කොට මේ ස්ථානය යුද්ධයට වටනේයයි කියා කිරිබොන සූකර දරුවන් සමග සූකර මැනිවරු මධ්‍යවූ ස්ථානේ සිටුවා මොවුන් වටකොට දිග අත් ඇති සූකරයන් සිටුවා යුද්ධයට සමර්ථ බල ඇති සූකරයන් දසදෙන විසිදෙන බැගින් සිටුවා බලකොටුවක්

කෙරෙයි. වඩ්ඪකී සූකර තෙම තමන් සිටින තැන ඉදිරිපිට මණ්ඩලාකාර වළක් කරවනලදී. හැට හැත්තෑවක් යෝධ සූකරයන් සමග එහාට මෙහාට යමින් භයවෙන්ට එපායයි ඒ ඒ අයට කියමින් සිටිනාතර අරුණෝදය විය.

ව්‍යාඝ්‍රයා නැගිට කල් පැමිණියේයයි කියා සූකර භූමියට ගොස් සූකරයන් දිශාව රවා බැලුවේය. වඩ්ඪකි සූකරතෙම තොපිත් ව්‍යාඝ්‍රයා දිශාව රවා බලවයි සංඥාවක් කෙළේයි. ඔවුහුද රවා බැලුවොයි. ව්‍යාඝ්‍රතෙම මුඛය ඇර ආශ්වාසකෙළේයි, සූකරරැළද එසේ කළෝ. ව්‍යාඝ්‍රතෙම මුත්‍ර පහකළ කල්හි සූකරයෝද එසේ කළෝ. ව්‍යාඝ්‍රයා කරණ සියල්ලම සූකරයෝද කළෝ. ව්‍යාඝ්‍රයා සිතන්නේ පූර්වයේ මම දුටු හැටියේ ම සූකර සමූහයා පලායති. භය කොපමණද දිවීම පවා කරන්ට ශක්තිය නැත. එසේ වූ තැන අද පලා නොගොස් මම කරණ දේ කරති. මීට හේතුව භූමිතලේ සිටින සංවිදහකයායයි සිතා අද ජයගැණීමක් නැතැයි කියා වසන ස්ථානයට ව්‍යාඝ්‍රයා ගියේය.

ව්‍යාඝ්‍රයා ගෙනෙන සූකර මාංශ කා පුරුදු කූට ජටිල තාපසයෙක් සිටියි. මේ දින හිස් අතින් එන ව්‍යාඝ්‍රයා දැක කූට ජටිලයා ව්‍යාඝ්‍රයාට කථාකොට හිස් අතින් එන්නේ පුරාණ ශක්තියට කුමක් වූයේ ද? වෙන දවස්වල භයින් පලායන සූකරයෝ අද යුද්ධයට ආවෝයයි ව්‍යාඝ්‍රයා උත්තර දුනි. කූට ජටිල තාපසයා ව්‍යාඝ්‍රයාට, භය නොවව් එක් නාදයක් කොට ඔවුන් මධ්‍යයට පැන්න කල භීතියෙන්

ඔව්හු පලා යන්නෝය. ව්‍යාඝ්‍රයා කූට ජටිලයාගේ වචනය නිසා වීර්ය හිතක් ගෙණ සූකරයන් කරාගොස් පර්වතතලේ සිටියේයි. සූකර රැල වඞ්ඪකී සූකරයා කථාකොට සාමි මහා හොරා නැවතත් ඇවිත් සිටියි, ගතහැකියයි වඞ්ඪකී සූකරයා කීවේය. ව්‍යාඝ්‍රතෙම නාදකරමින් වඞ්ඪකී සූකරයා උඩට පැන්නේය. සූකර තෙම ක්ෂණයකින් හැරී වළට පැන්නේය. ව්‍යාඝ්‍රතෙම නවතින්නට ක්‍රමයක් නැතුව පෙරලී ගොස් මඩවලට වැටුනේය.

සූකරතෙම ඉක්මනින් නැගිට ව්‍යාඝ්‍රයාගේ යටි බඩට දතින් ඇන වකුගඩු ප්‍රදේශය ඉරා දමා හිස තුවාළ කෙළේය. පසු ව්‍යාඝ්‍රයා ගොඩට දමා සූකර රැළට කථා කොට මෙන්න තොපගේ අමිත්‍රයා කීවේය. ප්‍රථම පැමුණුන සූකර රැළ මුගේ මස්ටික කා ඉවරකළෝ පසුව පැමිණුන සූකරයෝ මස් නොලැබ ව්‍යාඝ්‍ර මස් කෑ අයගේ මුබ සිඹ බැලුවෝයි. ව්‍යාඝ්‍රයා මැරූ නුමුත් සූකර රැළ සතුටට නොපැමුණුන බව දැන කුමක්දැයි විචාළේයි. සාමි එක ව්‍යාඝ්‍රයෙක් මැරීම පහසු වැඩකි. තව ව්‍යාඝ්‍රයන් දස දෙනෙක් ගෙනා හැකි කූට ජටිල තාපසයෙක් සිටී සූකර රැළ කීවාහුය. වඞ්ඪකී සූකරයා කූට ජටිලයා ඇල්ලීමට සූකර රැළ සමඟ ගියේ ය. වඞ්ඪකී සූකරයාද සූකර රැළද දුටු තාපසයා පරිෂ්කාර රැගෙන පලා යන්නේ ඒ බව දුටු සූකර රැළ ලුහුබඳවා පස්සේ දුවන්ටවූ කල තාපසයා බිම වැටුනු කල්හි ඔහු මරා දමන ලදී. මේ ජාතකයේ උගන්වනු ලබන අවවාදය සිතට ගෙණ දුර්වලවී සිටින සිංහලයන් සමගිව පංච දුශ්චරිත ක්‍රියා අත්හැරදමා සමගි

කමින් ක්‍රියාකරන්නටත් බුදුරජාණන් වහන්සේ අපේ ශාස්තෘන් වහන්සේ ය, අපේ කල්‍යාණ මිත්‍රයාය, අපට අනුකම්පා වෙන් ධර්මදේශනා කළේය, අපි උන්වහන්සේගේ ධර්මයට කීකරුව සමගිකම වර්ධනය කරමින් අපේ රට අපේ ජාතිය අපේ භාෂාව සමෘද්ධභාවය පමුණුවන්ට උත්සාහ කිරීම යුතු යි.

**(සිංහල බෞද්ධයා 1911.10.14)**



දවල සුදු අවතාර දුටු සඳ
වෙව්ල වෙව්ලා මිනිස් ගොන්නුව
කුලල බිඳගෙන දුවන සමයක
නිවට සිහලුන් උසි ගැන්නුව
සිහල පපුවක තිබෙන එඩිතර ගතිය
බටහිර දනට පෙන්නුව
සිහල ජාතික වීරයා සිහි කරව් !
අප පෙරමුණට ගෙන්නුව

**- හික්කඩුවේ බී. එච්. අමරසේන කිවි -**



05 වන කොටස

# වර්තමාන ලෝකයට බුදු දහම පහදා දෙන්නකු ගේ මතක සටහන්

අනගාරික ධර්මපාලතුමා විසිනි
(''ධර්මපාල ප්‍රතිරාවය'' කෘතියෙනි)

ඒ සම්මේලනයෙන් පසු ව මම බුද්ධගයාවට පෙරළා ආවෙමි. බෞද්ධ කටයුතු පිළිබඳ ව මා ඉතා ක්‍රියාශීලී ව වැඩ කළ නමුදු මා එ තෙක් ඇන්දේ බෞද්ධ උපාසකයකු ගේ සුදු වස්ත්‍ර ය. එහෙත් 1895 ඔක්තෝබර් මාසයේ දී මම කසා වත් පොරවා ගතිමි මම අනගාරික වූවෙමි.

සෑම පුද්ගලයකු ම තමා ම ජය ගෙන, තමා ගේ විමුක්තිය තමා ම සලසා ගත යුතු ය යන මූලික සිද්ධාන්තය කරණ කොට ගෙන, බුද්ධාගම පුදුම සහගත අන්දමින් සහනශීලී ය. බුද්ධාගම අන්‍ය කිසි ම ආගමකට වධ හිංසා පමුණුවා නැත. අනෙක් සියලු ම ආගම් බුද්ධාග මට වධ හිංසා පමුණුවා ඇත. අනෙක් සියලු ම ආගම්වල ආචාර්යවරයෝ ස්වමතාසක්ත ව, "උඹලා විශ්වාස කළ යුතු යැ යි මා කියන නිසා විශ්වාස කළ යුතු ය," යි ප්‍රකාශ කරති. එහෙත් බුදුන් වහන්සේ, කෙනෙකුට සත්‍ය කරා එළඹිය හැක්කේ පරීක්ෂණයේ නිදහස් මාර්ගයෙන් පමණක් බව උගන්වා වදාළ සේක. අන් සැමට ම වැඩියෙන්

බුද්ධාගම විග්‍රහාත්මක ආගමකි (විභජ්ජවාදි ආගමකි). මහ ජනතාව ගේ සිත් ආධ්‍යාත්මිකත්වයට පත් කළ හෙයින් එය ප්‍රජාතන්ත්‍රවාදී ආගමකි. බෞද්ධ ලෝකයේ පැවිද්ද ගෙන්, ජනතාව සඳහා කල්පනා කිරීමක් වත් ඔවුන් විශ්වාස කළ යුත්තේ කුමක් ද කියා කියා කීමක් වත් බලාපොරොත්තු නො වේ. එම නිසා, බුද්ධගයාවට පෙරළා පැමිණීමෙන් පසු මා කසාවත් ඇන්දේ, මානව වර්ගයාට වඩාත් හොඳින් සේවය කිරීමට ඉඩ සලසා ගන්නා අටියෙනි.

ඉන්දියාවේ සිටිත් දී, මම දිවා රාත්‍රී දෙකෙහි වැඩ කළෙමි. මගේ සෞඛ්‍යය ගැන මම සැලකිල්ලක් නො දැක්වීමි. දින පතා ආහාර සඳහා බත් පාත්‍රයකුත් එළවළු ස්වල්පයකුත් පැ හතරක නින්දකුත්, දැන් මෙන් මට ප්‍රමාණවත් වී ය. අවුරුදු දහයක් තිස්සේ කළ නොපසුබට උත්සාහයකින් පසු ව, බුද්ධගයාවට එන බෞද්ධ වන්දනා කරුවන් උදෙසා සැප දයක විශ්‍රාම ශාලාවක් ඉදි කිරීමට රජයේ අනුමැතිය ලබා ගතිමි. එය කාමර දහයකින් ද පන් සිය දෙනෙකුට පමණ රැස් විය හැකි රැස්වීම් ශාලාවකින් ද ආරාමයක මෙන් තනන ලද ලොකු කොරිඩෝරයකින් ද සමන්විත වී ය. ඈත පළාත්වලින් පැමිණෙන වන්දනා කරුවන්ට ගත සනසා ගනු සඳහා ස්නානාගාරවලින් ද දිළිඳු සංචාරකයන්ට තමන් රැගෙනඑන ආහාර පිස ගැනීම සඳහා මුළු තැන් ගෙයකින් ද යුක්ත වී ය. ආසියාවේ සෑම පළාත්වලින් ම අවුරුදු පතා පැමිණෙන්නා වූ වන්දනා කරුවන් පන් සිය හෝ

හය සිය දෙනෙකුන් ගේ භෞතික හා ආධ්‍යාත්මික ඕනෑ එපාකම් සපුරා ලනු සඳහා නේවාසික භික්ෂූන් වහන්සේලා දෙ තුන් නමක් ද මම ද සැදී පැහැදී සිටියෙමු. අපට කිසි කලෙක හුදෙකලා භාවයක් නොදැනුණේ ය. එ මෙන් ම ගෞතම බුදුන් වහන්සේ ආධ්‍යාත්මික ජයග්‍රහණය ලද ඒ ශාන්ත වන රොදෙහි දී අපට බාහිර ලෝකයේ කටයුතු ද නො දැනී නොගියේ ය.

එහෙත් විශ්‍රාම ශාලාව පමණක් ප්‍රමාණවත් නො වී ය. සිය ආගමෙහි ගම්භීර වූ දර්ශනික හා මනෝ විද්‍යාත්මක සත්‍යයන් පිළිබඳ හසළ දැනුමක් ලබනු සඳහා තරුණ ජනයා බෞද්ධ ආරාමවලට ඇදී ආ ඒ පුරාණ කාලයේ ජීවය යම් තරමකින් හෝ යළි ඇති කිරීම මගේ අභිලාෂය වී ය. බුද්ධගයාවේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා දස දහස් සංඛ්‍යාවක් රැස් වී සිටි ඒ කාලය යළි මතක් කර ගැනීමට මට වුව මනා වී ය. මේ ශුද්ධ භූමියෙහි බෞද්ධ විද්‍යාලයක් පිහිටුවීම මගේ අභිලාෂය වූ නමුදු එය සාර්ථක කර ගැනීමට මට නොහැකි වී ය. එසේ වුව ද, එක ම අරමුණක් ඔස්සේ අප දීර්ඝ කාලයක් තුළ ගත් උත්සාහය, නිශ්ඵල නොවූයේ ය. ශත වර්ෂ සතක කාලයක් තිස්සේ නො සලකා හරිනු ලැබුවා වූ ද, අමතක කර දමනු ලැබුවා වූ ද බුද්ධාගමේ ආභාසය සිය ජන්ම භූමියෙහි යළිත් වරක් පැතිරෙන්නට පටන් ගෙන ඇත්තේ ය.

බුද්ධගයාවෙහි අවුරුදු දහ හතක් මා වැඩ කළාට පසු, නේවාසික භික්ෂූන් වහන්සේලා දෙ තුන් නමට ද මට

ද - සිංහල බෞද්ධයන් වූ අප සියලු දෙනාට - ආපසු යන ලෙස රජය බල කළේ ය. මම එ කෙණෙහි ම, මහාබෝධි සමාගමේ වැඩ කටයුතු කල්කටාවට මාරු කළෙමි. බුද්ධගයාව පිළිබඳ ව තව දුරටත් වැඩ කිරීමට කාලය සුභ නොවූයෙන්, මම මගේ ශක්තිය ලංකාවේ බෞද්ධ කටයුතු වෙනුවෙන් යොදවන්නට පටන් ගත්තෙමි. කෙසේ වුව ද, 1915 දී ආපසු කල්කටාවට පැමිණි මට, එහි සුන්දර බෞද්ධ විහාරයක් ඉදි කිරීමට පුළුවන් කම ලැබිණ. එය 1920 නොවැම්බර් මාසයේ දී බෙංගාලයේ ආණ්ඩු කාර තැන විසින් විවෘත කරන ලදී.

බුද්ධාගමට සතුරු රටක් වූ ඉන්දියාවේ දී, මම නිරන්තරයෙන් ම ප්‍රවාහයට විරුද්ධ ව සටන් කළෙමි. ලංකාවේ දී මා සිටියේ මගේ ම රටෙහි ය. විදේශිකයන් ගේ ආගමික වධ හිංසා නිසා ලංකාව පිරිහී තිබුණ ද, අරටුව එ තෙක් බෞද්ධ ම වී ය. බොහෝ විට උදසීන වුව ද කිසි කලක මගේ අරමුණට විරුද්ධ කම් නො පෑ ජනතාව සමඟ, ජනතාව වෙනුවෙන් මට වැඩ කළ හැකි වී ය.



# වස්සානයේ අස්වැන්න

"සසුන් රුවන්"

පින්බර වස්සානය,
දනන් සිත් කුසලය තුළ රඳවන,
උතුරු මනු දහමින් පිරුණු පිරිසක් ලොවැ බිහිකරන,
මේ උතුම් කාලය බැව් ඔබට අමතක ද?
දිනත් සතිත් පොහෝ දෙකකුත් දැන් ගෙවී ගොස්,
බිනර පොහොය අද එළැඹිලා.......
පෙර එද අප ගොයුම්ගොත් බුදුන් දවසේ,
අදින්,
සිවු සසිය දෙදහස් වසක් කල් ඉක්ම ගිය තැන,
කිඹුල්වත්පුර නුගරුක් අරමේ, කිරි මවුන් කළ ඇරයුමෙන්
ලැබුණේ,
මනු කතට ලොවැ උතුම් වරය යි.............

කෙස් වැටිය නැත හිසෙහි රැඳුණේ
කසාවත ඔබෙ කයෙහි රැඳුණේ
අම නිවන් මඟ දෙරටු ඇරුණේ
පිනැති මව්වරු එමඟ වැඩියේ

පිනැති මව්වරු මෙය අසත්වා..................!

නිමක් නැති මේ සසර කතරේ
රැඳුනි ඔබ තව තවත් අතොරේ
අනියතයි මේ ලැබුණු දිවියත්
හොඳින් ඔබ එය වටහ ගන්නේ

ඔබත් සසරින් එතෙර වන්නේ
කෙලෙස් අරවන මඟ වඩන්නේ
පහන් සිළ මෙන් නිවී යන්නේ
කවදා ද ඒ දිනය එන්නේ



# ශ්‍රීමත් අනගාරික ධර්මපාල ශ්‍රී නාමය සිහි කරමු

අනගාරික ධර්මපාල ශ්‍රී නාමය සිහි කරන්න
තෙරුවන් වැඳ උදේ හවස පින් අනුමෝදන් කරන්න.

බුද්ධ භූමියට බුදු හිමි ගෙන ගිය පින්වතාණෝ ය
මූලගන්ධ කුටිය මතින් පෑයූ පුන්සඳාණෝ ය
රට රටවල මහ මුනි බණ පළ කළ දූතයාණෝ ය
මහාබෝධි සෙවණේ මතු බුදු වන බෝසතාණෝ ය.

සිංහල ගොන්තඩියන්ගේ මොළ සේදූ වෙදණෝ ය
සුද්දන්ගේ පාහරකම් මැඩ ලූ සිහරදණෝ ය
සංකර සිරිතට එරෙහිව හඬ දුන් කථිකයාණෝ ය
මතු මතු සිරිලක ඉපදිය යුතු යුග පුරුෂයාණෝ ය.

අනගාරික ධර්මපාල ශ්‍රී නාමය සිහි කරන්න
තෙරුවන් වැඳ උදේ හවස පින් අනුමෝදන් කරන්න.

රැසැයුම:- **මහාචාර්ය සුනිල් ආරියරත්න සූරිහු**
ගැයුම:- **සගයු වෙසරද නන්ද මාලිනී මහාත්මනිය.**



# දරුවන් ගේ සිරිත් සිරිමත් කරවන සිරි දම්පල් රුවන් වැකි

පුෂ්පා ජයවර්ධන මහාත්මනිය විසිනි

## ළමයින් විසින් කටයුතු දේ

01. ඉර උදා වෙන්ට ප්‍රථම නැගිට මූණ අතපය ඇඟ සෝදා පිරිසිදු වස්ත්‍ර හැඳ ස්වල්ප වේලාවක් එකතැනක බද්ධපර්යංකයෙන් වාඩිවී සිට ඉහළට පහළට යන හුස්ම යන එන අන්දම සිහියෙන් යුක්තව බලා සිටීම තමන්ගේ මොළේ ශුද්ධ වීමට ද ධාරණ ශක්තිය වැඩි වීමට ද කාරණයක් වන බැවින් මේ ආනාපානසති ක්‍රමය ශාස්ත්‍ර ඉගෙන ගන්න සියලුදෙනා විසින් කළ යුතු ය.

02. දින පතා ම පන්සිල් සමාදන් විය යුතු යි. දින පතා මත් යටත් පිරිසෙයින් එක මලක්වත් පූජා කළ යුතු යි.

03. පාඩම් කරන වේලාව නොවළක්වා පිළිවෙලින් හැමදම පාඨශාලාවට යන්ට ප්‍රථම දෙමව්පියන්ට වැඳ පාඨශාලාවට යා යුතු යි.

04. ගුරුවරයා ඉදිරියේ දී යටහත් භාවයෙන් ක්‍රියා කළ යුතු යි.

05. පාඨශාලා ගෘහයේ බිම කෙළ නො ගැසිය යුතු යි.

06. දුම්කොළ, සුරුට්ටු, බුලත් ආදිය නො කෑ යුතු යි. නරක වචන, ඕනෑ නැති වචන, කුණු කථා නො කිය යුතු යි.

07. මාළු අල්ලන තැනක, සතුන් මරණ තැනක, බීම විකුණන තැනක, බීම බොන තැනක, සූදු පොළක නොසිටිය යුතු යි.

08. කේලාම් නො කිය යුතු යි. බොරු නොකිය යුතු යි. තමන්ගේ ආගම දියුණුවට ද, රට දියුණුවට ද, ජාතිය දියුණුවට ද, නිරතුරුව ක්‍රියා කළ යුතු යි.

09. අයුත්තට කිසි කෙනෙකුට භය නොවිය යුතු යි.

10. ශරීරය ශක්තිමත් කර ගැනීම පිණිස හරඹ ඉගෙණ ගැනීම යුතු යි.

11. සතියකට වරක්වත් ළඟ තිබෙන පන්සලට මෑණියන් සමඟ ගොස් බණ ඇසිය යුතු යි.

12. වැඩිමහලු උදවියට ගරු වචනවලින් කථා කිරීම කළ යුතු යි.

13. භික්ෂූන් වහන්සේලා සහ දෙමව්පියන් ඉදිරියේ උස් ආසනයක වාඩි නො විය යුතු යි.

14. සිංහල ජාතියේ ළමයින් සමඟ ප්‍රේමයෙන් සිටිය යුතු යි.

15. සතුන්ට කරුණාව පෙන්විය යුතු යි.

16. පසළොස්වක දිනවල අටසිල් සමාදන් විය යුතු යි.

17. තමන්ට ලද පමණින් බුද්ධාගමේ වැඩට ආධාර දිය යුතු යි.

18. කිතිකැවීම, භය ගැන්වීම, සෙල්ලම් පිණිස නරක වචන කීම අත් හැරිය යුතු යි.

ආර්ය ජාතික උතුම් ධර්මයක් සරණ යන සිංහලයන්ගෙන් පැවත එන ප්‍රිය සිංහල දරුවෙනි, පළමු කොට නුඹලා විසින් පවිත්‍ර කම ඉගෙන ගත යුතු යි. තමන් පරිභෝග කරන පාවිච්චි කරන ඇඳ පුටු වස්ත්‍රාභරණ සියල්ලක් ම පවිත්‍රව තබාගත යුතු යි.

**(සිංහල බෞද්ධයා 1923.02.24)**

"සිංහල බෞද්ධ දරුවෙනි, දිවි යතත් බොරුවක් මුසාවක් නොකියන්නට අධිෂ්ඨාන කරගනිත්"

**(සිංහල බෞද්ධයා 1923.03.24)**

"අපි දැන් ප්‍රබෝධයෙන් උට්ඨාන වීර්යයෙන් වැඩ කළ යුත්තම්හ. අනිත් සිංහල ළමයින්ට මෙන් ම මටත් අන්තරාය මාර්ගයේ ගමන් කරන්නට සිද්ධ වූයේ ය. නමුත් මගේ ආගම භක්තිය දැඩි බැවින් මාර පාශයට මා අසු කරගන්ට බැරි විය. මම පිරිසිදු ජීවිතයක් ගත කරන්නට කැමති වූ බැවින් විසි අවුරුද්දේ දී බ්‍රහ්මචාරී ව ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කරන්නට පටන් ගත්තෙමි. අන්තරා විරහිත ක්ෂේම මාර්ගය නම් මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය පමණකි. අන්‍ය ආගම් නුඹලා මුළාවේ හෙළත්. ඒ හෙයින් ධෛර්යවත් වව්. කාය වාග් මනඃ යන ද්වාරත්‍රයෙන් පිරිසිදු වව්. ආරක්ෂා වව්."

**(සිංහල බෞද්ධයා 1924.01.05)**

"පස් අවුරුදු කාලේ සිට සිංහල දරුවන්ට බුදුරජාණන් වහන්සේගේ අසමසම චරිතය කියාදීම දෙමව්පිය ගුරුවරයන් විසින් කටයුතුයි. දිනක් පාසා බුද්ධවංශය, චරියා පිටකය, ජාතක ප්‍රකරණ කියවීමෙන් දේවාතිදේව බ්‍රහ්මාතිබ්‍රහ්ම භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අප්‍රමාණ අනේක ගුණ දැනගන්නේය. වර්තමාන බෞද්ධ ස්ත්‍රී පුරුෂයෝ සම්මා සම්බුදුරජාණන් වහන්සේට භක්ති ප්‍රේම ශ්‍රද්ධා ආදර පෙන්වන්නේ නැත. එවැනි දෙමව්පියන්ට ලැබෙන දරුවෝ කාලකණ්ණි භාවයට පත් වී මරණින් මතු නරකයෙහි උපදීම කරත්. පාඨශාලාවල බාලක බාලිකා ශිෂ්‍යයන්ට ජාතක දිනපතා කියවා තේරුම් කරදීම ගුරුවර ගුරුවරියන්ට භාරයි."

**(සිංහල බෞද්ධයා 1923.03.17)**

"සිංහලයන්ට ස්වජාතික ප්‍රේමය නැත්තේ පරජාතික ගුරුන් යටතේ බාල කාලයේ පටන් හැදෙන නිසා ය. පරජාතික ගුරුවරයා බාල කාලයේ පටන් සිංහල සිරිත් විරිත්වලට නිග්‍රහ කරයි. ඊට හේතුව සිංහලයන් අතර සමඟිය නැති කමයි. සමඟියට ප්‍රධාන හේතුව මෛත්‍රිය වර්ධනය කිරීම යි. අසත්පුරුෂ ධර්ම භාවිතා කිරීමෙන් සමඟි ධර්මය පිරිහෙන්නේ ය. දැනට ඕනෑකරන්නේ මෛත්‍රිය හා සමඟිය වර්ධනය කිරීම යි."

**(සිංහල බෞද්ධයා 1911.08.12)**

"වරද දුටු තැන ඒ පෙන්නා දීම මගේ ගතියකි. ඇතැම් අය මෙසේ කරනවාට අසතුටුයි. වරද කළ අයට නිග්‍රහ කිරීම, අවවාද අනුශාසනා කිරීම, බුදුරජාණන් වහන්සේ අනුකම්පා සිතින් කර තිබේ. දෙමවුපිය ගුරුවරාදීන්

විසින් වරද කළ දූදරු ආදීන්ට තර්ජනය කිරීම සම්මතයි. අවවාද පිළිගැණීමට අසතුටු තැනැත්තෝ ධර්ම මාර්ග යේ යාමට ද අකමැති වෙති. මවිසින් කරණ අවවාද පිළිගැණීමට අසතුටු නම් ඒ බව දැන්වූ විට ලංකාව අත්හැර වෙන රටකට පැමිණ විසීමට මට පුළුවන. සිංහල රට, සිංහල ජාතිය, සිංහල භාෂාව උතුම් කොට සළකන මට සිංහල බෞද්ධයන් මිථ්‍යාදෘෂ්ටීන් වෙනවා දැකීම ඉවසිය නොහැකිය.

**(සිංහල බෞද්ධයා 1911.10.07)**

"බුද්ධ වචනයේ බලයෙන් පස් පවින් සම්පූර්ණයෙන් වැළකී සිටින උපාසකයාට 'දේව' යන නාමය ද උපාසිකාවට 'දේවී' යන නාමය ද ගත හැකි ය. අංගුත්තර නිකායේ පංචක නිපාතය බලනු."

**(සිංහල බෞද්ධයා 1912.03.16)**

"මෙතැන් පටන් පස් හැවිරිදි වයස් බෞද්ධ දරුවන්ට ආර්ය චාරිත්‍ර ඉගැන්වීමට බෞද්ධ දෙමවුපියන් විසින් තදින් සිත් ලී ගත යුතු යි. දුටුගැමුණු කාලයේ සිංහලයන් මෙන් ශූර, වීර සිංහල පරම්පරාවක් ප්‍රකෘතිමත් කිරීම ඕනෑ. බාල වයසේ පටන් අපේ සිංහලයන්ට මැසි, මදුරු, සීත, සුළං ආදියෙන් පැමිණෙන අන්තරායවලින් පරෙස්සම් කොට රස ආහාර කන්ට දී පවිත්‍ර වස්ත්‍ර අන්දවා පස් පව් දස අකුසල්වලින් වෙන් වීමට නිතර කියා ද හරක් මස්, ඌරුමස්, කරෝල, ජාඩි, උම්බලකඩ කන්ට නො දී, සුරුට්ටු, දුම්කොළ, මත්පැන් බොන්ට නො දී බ්‍රහ්මචාරී ලීලාවෙන් හැදීම කටයුතු යි.

**(සිංහල බෞද්ධයා)**



# Srimath Anagarika Dharmapala – Noble Son of Lanka

Compiled by:
**Srima Warusawithana**

In letters of gold – your name is etched
Anagarika Dharmapala - revered for service nobly done
A true Bodhisatva ideal – a life of sacrifice, courage and endeavor,
A voice like thunder, resonating a deep love for Sri Lanka,
Fearlessly pointing the way to live, a virtuous life,
Devoid of false values, not imitating alien culture,
Yet extracting the good in others customs, from lands across the seas,
Born to affluence, an easy life;David - a name that meant nothing to him,
He changed to Dharmapala – a devotee of the Buddha's gentle teachings,
Forsaking a life of luxury, wealth and glory in worldly terms,
Went further on to a homeless simple life – denoted "Anagarika"
And in later years this noble son of Lanka donned the saffron robes
To become Sri Devamitta Dhammapala Thera.
His stentorian voice echoed and re-echoed in Lanka,
In neighboring India, and also far across the globe,
Swiftly carrying on the powerful message of the Dhamma,
The Buddhist way of life, always mingled with compassion,
Though his words were strong and fiery;
To the corners of Jambudipa – the land of the Buddha's birth,
To preserve and hold sacred the footprints,
The paths where the Buddha tirelessly trod,
Through forty five long years;
So every faithful that visits here shall behold the splendor in adoration,
And venerate the sacred places with gladsome hearts.
For this, Sri Lanka remains ever grateful,
To the honoured name of Lanka's noble son –
Srimath Anagarika Dharmapala.